www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කීර්ති බාලසූරිය 1970-71 අවධියේ විප්ලවවාදී සටන්කරුවා ලෙස

**Keerthi Balasuriya as revolutionary fighter during 1970-1971**

**විලානි පීරිස් විසිනි**

**2007 දෙසැම්බර් 21**

*සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස) පිහිටුවූ 1968 පටන් එහි ප්‍රධාන ලේකම් ව සිටි කීර්ති බාලසූරිය, 1987 දෙසැම්බර් 18 වන දින අකාලයේ මිය යන විට 39 වන වියේ පසුවිය. ඔහු ගේ මරනය විසින්, පශ්චාත් යුද්ධ කාලපරිච්ඡේදය තුල ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය සතුවූ අතිශය දීප්තිමත් නියෝජිතයෙක් එයට අහිමි කලේය.*

*මෙම ලිපිය තුලදී විලානි පීරිස් 1970-71 අවධියේ කීර්තිගේ ජීවිතය සිහියට නංවයි. එය විකොස පිහිටුවීමේ තීරනාත්මක වකවානුවක් විය. එවිට විසිවෙනි වියේ පසුවූ කීර්ති, පරීක්ෂනයට බඳුන් කෙරුනු මෙම අත්දැකීම් තුලින් පක්ෂය මෙහෙය වූ අතර, ශ්‍රීලංකාවේ ද දකුනු ආසියාවේ මෙන්ම ජාත්‍යන්තරව ද ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය වූ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ඉදිරි දර්ශනයට මහඟු දායකත්වයක් සැපයීය. 1971 පටන් ඔහු මිය යන තෙක්ම කීර්තිගේ සහකාරියව සිටි පීරිස්, සසප දේශපාලන කමිටුවේ සාමාජිකාවකි.*

*සමාජවාදී සමානතා පක්ෂය හා සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ එක්ව දෙසැම්බර් 23 දින සවස 3 ට කොලඹ මහවැලි කේන්ද්‍රයේදී කීර්ති බාලසූරියගේ අභාවයේ විසිවෙනි සංවත්සරය සමරමින් ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වයි.*

මට ප්‍රථම වරට කීර්ති මුනගැසුනේ විකොස අධ්‍යාපන කටයුතු සැලසුම් කිරීම සඳහා පැවති රැස්වීමකදී ය. මොරටුවේ මගේ ගම් පලාතෙන් බැහැර විකොස සාමාජිකයන් ප්‍රථම වරට මට හමුවූයේ ද මෙහිදී ය.

රැස්වීම ආරම්භයේදී ම මූලාසනයේ සිටි අය ඉල්ලා සිටියේ සියල්ලන් ම සාකච්ඡාව අවසන් වන තෙක් රැඳී සිටින ලෙසයි. මගේ සහෝදරිය හා මම නැගී සිට කලින් පිටව යෑමට අවසර ඉල්ලා සිටියෙමු. මූලාසනය එකඟවූ නමුත් සභාව තුල නැඟී සිටි කලුකොටු සහිත කමිසයක් හැඳි හීන්දෑරි තරුන සහෝදරයෙක් විරුද්ධත්වය පලකලේය. මාක්ස්වාදී ව්‍යාපාරයට රෝසා ලක්සම්බර්ග්ගේ ඉමහත් දායකත්වය කෙටියෙන් පැහැදිලි කල ඔහු බැරෑරුම් හඬකින් අවධාරනය කලේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ නායකත්වය තුල කාන්තාවන් වැඩ කල යුතු බවයි. ඒ කීර්ති බාලසූරියයි. එදින අප වේලාසනින් පිටව ගියත්, කීර්ති කිවූ දෙයින් මා තුල ගැඹුරු බලපෑමක් ඇතිකලේය.

1969 විකොස අධ්‍යාපන කවයට මම සම්බන්ධ වුනෙමි. කීර්ති විසින් නායකත්වය දුන් කන්ඩායම ද ඇතුලුව එහි කන්ඩායම් දෙකක් විය. ප්‍රථම ලෝක සංග්‍රාම අවධියේ ලෙනින්ගේ "විප්ලවවාදී පරාජකවාදයේ" ආස්ථානය හා එහි දේශපාලන වැදගත්කම ගැන ඔහු දේශනයක් කලේය. දෙවන ජාත්‍යන්තරයේ පක්ෂවල පාවාදීමට එරෙහිව ලෙනින් අවධාරනය කලේ, කම්කරුවන්ගේ වගකීම අධිරාජ්‍යවාදී යුද්ධය සිවිල් යුද්ධයකට හැරවීම මඟින් සෑම රටකදී ම තමන්ගේ ම ධනේශ්වර ආන්ඩුවලට එරෙහිව සටන් වැදීම බවයි.

කීර්තිගේ මාක්ස්වාදය පිලිබඳ ඉගැන්වීම් බොහෝ සහෝදරවරුන් පුබුදුවාලීය. 1953 හා 1963 පැබ්ලෝවාදී සංශෝධනවාදයට එරෙහිව හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක) ගෙනගිය අරගලය ගැන කීර්ති මා සමඟ සාකච්ඡා කලේ මා විකොස මොරටුව ශාඛවට බැඳීමටත් පෙරය. කම්කරු පන්තියේ විප්ලවවාදී ක්‍රියා කලාපය ප්‍රතික්ෂේප කල පැබ්ලෝවාදීන් එහි දේශපාලන ස්වාධීනත්වය සඳහා සටන අත්හැර දමා ස්ටැලින්වාදයට යටත්වූ බව ඔහු විස්තර කලේය. ශ්‍රීලංකාව වැනි ආර්ථිකව පසුගාමී රටවල දී පැබ්ලෝවාදීන් කම්කරු පන්තියේ ඓතිහාසික කාර්යභාරය විවිධාකාර ධනේශ්වර හා සුලු ධනපති ජාතිකවාදී නායකත්වයන්ට අතහැර දැමීය.

පැබ්ලෝවාදයට එරෙහි අරගලයේ පාඩම් අධ්‍යයනය නොකර ලංකා සමසමාජ පක්ෂයේ (ලසසප) පාවාදීම අවබෝධ කරගත නොහැකි බව කීර්ති අවධාරනය කලේය. ලසසප 1964 දී සිරිමාවෝ බන්ඩාරනායකගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ (ශ්‍රිලනිප) ආන්ඩුවට ඇතුල්වීම, පැබ්ලෝවාදීන් විසින් දිරිගන්වන ලද දිග් ගැස්සුනු පරිහානියක නිමැවුමක් විය.

දුම්රිය කම්කරුවන් ද ඇතුලු ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුල ඉතිහාසයක් තිබූ වයස්ගත කම්කරුවන්

සමග 1970 දී, කීර්ති සාකච්ඡා වට ගනනාවක් ම පැවැත්වීය. ඔවුහු 1940 ගනන්වල ඉන්දු-උපමහාද්වීපය තුල හතරවන ජාත්‍යන්තරයේ ශාඛාව වූ ඉන්දීය බොල්ෂෙවික් ලෙනින්වාදී පක්ෂයේ (බීඑල්පීඅයි) සාමාජිකයෝ වූහ. නැතහොත් ඔවුන් 1950 දී බීඑල්පීඅයි වෙතින් බැහැර වන විට සමසමාජ පක්ෂයේ සමාජිකයන්ව සිටි අයයි. 1964 පාවාදීමෙන් පසුව ඔවුන් සමසමාජයෙන් කැඩී බාලා තම්පෝගේ හා එඩ්මන් සමරක්කොඩිගේ විප්ලවකාරී ලංකා සමසමාජ පක්ෂයට (ලසසප(වි) බැඳුනහ.

1970 වන විට මෙම කම්කරුවන් ලසසපයේ පාවාදීම කෙරෙහි පමනක් නොව ලසසප(වි) ට්‍රොට්ස්කිවාදය සඳහා අරගලය අතහැර දැමීම කෙරෙහි ද තරයේ ම වික්ෂෝභයට පත්ව සිටියහ. තම්පෝ හා සමරක්කොඩි, බන්ඩාරනායක ආන්ඩුවට ඇතුල්වීමේ ලසසප තීන්දුවට විරුද්ධ වුවද හජාජාක හා එහි විශ්ලේෂනය ප්‍රතික්ෂේප කරමින් ඔවුන්ගේ ම ජාතිකවාදී න්‍යාය පත්‍රය පෙරට ගෙන ගියහ. මෙම සාකච්ඡාවලින්, ව්‍යාපාරයට කැපව සිටි සිය ගනනක් ට්‍රොට්ස්කිවාදීන් ලසසප හා ලසසප(වි) විසින් අවමංගත කලේ කෙසේද යන්න පිලිබඳ මනා වැටහීමක් කීර්තිට අත්කර දුන්නේය.

ජාත්‍යන්තර පක්ෂයේ අවශ්‍යතාවය පිලිබඳ වැටහීම මත පදනම්ව සිටි කීර්ති, හජාජාක ශ්‍රීලංකාවට මැදිහත්වීමේ වැදගත්කම අවධාරනය කලේය. හජාජාක බ්‍රිතාන්‍ය ශාඛාව වූ සමාජවාදී කම්කරු සංගමයේ (එස්එල්එල්) පුවත්පත වූ *නිව්ස් ලෙටර්* හි ලසසපයේ පාවාදීමට එරෙහි අරගලය පිලිබඳව පලවූ ලිපි නිරන්තරව ගෙනහැර දැක්වීය. 1964 ජූනි මාසයේ සභාගයට ඇතුලුවීමේ තීන්දුව ගත් ලසසප සම්මේලනය පැවති දිනවල එස්එල්එල් හි ප්‍රධාන ලේකම් ජෙරී හීලි ශ්‍රීලංකාවට පැමිනියේය. විල්ෆ්‍රඩ් පෙරෙයිරා නොහොත් "ස්පයික්" හා සිසිර ජයසූරිය යන විකොස ආරම්භක සාමාජිකයන් දෙදෙනාම කීර්ති හමුවීමට පැමිනියහ. ඔහුට වඩා වසර කිහිපයකින් වැඩිමහල් ජයසූරිය පසුව කීර්ති අධ්‍යාපනය ලැබූ ආනන්ද විද්‍යාලයේ සාහිත්‍ය සංගමයක් ගොඩනගමින් සිටින අතරතුර ඔහු හමුවිය.

ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලවයේ න්‍යාය මත දෘඪතරව පදනම්ව සිටි කීර්ති ලසසපය හා අවස්ථාවාදී ලසසප(වි) නායකයන්වූ තම්පෝ හා සමරක්කොඩි හෙලිදරව් කිරීම සඳහා ඔහු සතුව තිබූ සියලු හැකියාවන් ප්‍රයෝජනයට ගත්තේය.

මාවෝ සේතුං, ෆිඩෙල් කැස්ට්‍රෝ හා හෝචිමිං "මාක්ස්වාදී නායකයන්" ලෙස හුවා දැක්වූ එවක " චේ ගුවේරා ව්‍යාපාරය" නමින් ප්‍රකටව සිටි සුලු ධනපති ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග 1970 දී තම්පෝ අවස්ථාවාදී සංධානයක් ගොඩ නැගීය. ජවිපෙ, ජාතිකවාදී මතුපිටක් සහිත වූ මෙම ස්ටැලින්වාදී හා ගරිල්ලාවාදී ව්‍යාපාර තමන්ගේ ම සිංහල ස්වෝත්තමවාදය සමග එකට කැටි කලේය.

කම්කරු පන්තිය වෙතට නොව ගම්බද පීඩිත තරුනයන් වෙතට යොමුවීගත් ජවිපෙ වැනි සංවිධානවලට දොර විවර වූයේ ලසසපයේ පාවාදීමෙනි. එලෙස ම, වෙන ම රාජ්‍ය කැබලිත්තක් වෙනුවෙන් පෙනීසිටිමින් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය උතුරු නැගෙනහිර දෙමල ජනතාව අතර හිස එසවීය. ජවිපෙ මෙන් ම එල්ටීටීඊ ය ද ලසසපය බන්ඩාරනායක ආන්ඩුවට ඇතුල්වීම පෙන්වා දුන්නේ ට්‍රොට්ස්කිවාදයේ අසාර්ථක වීම ලෙසය.

විකොස සිංහල මාධ්‍යයෙන් පල කල කම්කරු පුවත් පත්‍රයට කීර්ති, ජවිපෙ පෙල ගැසීම සම්බන්ධ දීප්තිමත් විශ්ලේෂනයක් අඩංගුකරගත් *ජනතා විමුක්ති පෙරමුනේ දේශපාලනය හා පන්ති ස්වභාවය* නමින් යුත් ලිපි මාලාවක් සම්පාදනය කලේය. පසුගාමී රටවල "විප්ලවවාදී බලවේගය" ගොවි ජනතාව බව අවධාරනය කල ජවිපෙට එරෙහිව කීර්ති, 1927 චීන විප්ලවය පරාජය වීම තරම් ඈතට යමින් මාක්ස්වාදී ව්‍යාපාරයේ අත්දැකීම් විශ්ලේෂනය කලේය. සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය මත ගම්බද ජනතාව මෙහෙයවා ගැනීම මගින් ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් මෙන් ම සමාජ අවශ්‍යතාවන් ද සාක්ෂාත් කල හැක්කේ කම්කරු පන්තියට පමනක් බව ඔහු තහවුරු කලේය.

දිගු ලිපි පලකිරීමෙන් කම්කරු පුවත් හි ජනප්‍රියත්වය පහත වැටිය හැකිය යි තර්ක කරමින් ජවිපෙ පිලිබඳ විශ්ලේෂනය අව තක්සේරු කල ප්‍රමුඛ සාමාජිකයන් ගනනාවකට ම කීර්ති අභ්‍යන්තර පක්ෂ සාකච්ඡා තුලදී විරුද්ධ වූ බව මට මතකය. කීර්ති අවධාරනය කලේ අපගේ පුවත් පතෙහි දිශාවනතිය වැඩිදියුනු කම්කරුවන් හා බුද්ධිමත් තරුනයන් වෙතට මිස පසුගාමී ස්තරයන් වෙතට නොවන බවයි.

දශක තුනකටත් වැඩි කාලයකට ඔබ්බෙහි කීර්ති කල විශ්ලේෂනයේ නිවැරදි බව සනාථ වී තිබේ. ජවිපෙ එහි "මාක්ස්වාදී" හා රැඩිකල් මැත දෙඩවිලි මුලුමනින්ම පාහේ ඉවත දමා දේශපාලන සංස්ථාපිතයේ කොටස්කරුවෙකු බවට පත්ව ඇති අතර සිංහල ස්වෝත්තමවාදයේ අතිශයින් ම පසුගාමී රූපාකාරයන් වැලඳ ගනිමින් වර්ගවාදී යුද්ධය උත්සන්න කල යුතු යයි කියා සිටිති.

පසුව පොතක් වශයෙන් පලකල ජවිපෙ පිලිබඳ කීර්තිගේ ලිපි තරුනයන් අතර ජනප්‍රිය විය. ජවිපෙ මෙයට ප්‍රතිචාර දැක්වූයේ විකොස බියවැද්දීමට ශාරීරික ප්‍රචන්ඩත්වය යොදාගැනීමට උත්සාහ දරමින්ය. එවක විද්‍යෝදය විශ්ව විද්‍යාලය ලෙස හැඳින්වූ දැන් ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ විකොස රැස්වීමකට බෞද්ධ භික්ෂූන් ද ඇතුලු ජවිපෙ ආධාර කරුවන් පිරිසක් කඩා වැදුනහ. කෙසේ වුව ද පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ දී විකොස ශිෂ්‍යයන් අතර දිනාගෙන සිටි

සහයෝගය හමුවේ ජවිපෙ ප්‍රකෝපකරනයන් නිරර්ථක විය.

ජවිපෙ ක්‍රියාකාරකම් තිබියදී ම විකොස, පලමුවෙන් එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව හා දෙවනුව 1970 දී බලයට පත් දෙවන සභාගය යටතේ, එය රාජ්‍ය මර්දනයෙන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්‍යානුකූල ආස්ථානයක පිහිටා කටයුතු කලේය. "අද චේගුවේරා ව්‍යාපාරය මර්දනය කරන බලවේගයන් හෙට දින කම්කරු පන්තිය හා පීඩිත ජනතා සංවිධාන මර්දනය කරනු ඇතැයි  කම්කරු පුවත්  පත්‍රයෙන් අනතුරු ඇඟවීය.

## ජවිපෙ නැගිටීම

1971 අප්‍රේල් මාසයේ ජවිපෙ ක්‍රියාත්මක කල ගම්බද තරුනයන්ගේ සන්නද්ධ නැගිටීම තුල හරියට ම සිදු වූයේ එයයි. ලසසප ඇමතියන් ද ඇතුලත් සභාග ආන්ඩුව භීෂනකාරී මර්දනයකින් එයට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රතිඵලය වූයේ  තරුනයන් 15,000 කගේ ජීවිත විනාශ වීමය. මර්දනය ජවිපෙට පමනක් සීමා වූයේ නැත. එය සියලු දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව දිගේලි කල අතර විකොසට සැඟවී කටයුතු කිරීමට සිදුවිය.

පොලිසිය මොරටුවේ පිහිටි කීර්තිගේ පුස්තකාලයට කඩාවැදුනු නමුත් ඒ වනවිට ඔහු එහි නොසිටියේය. සන්නද්ධ පොලිස් භටයන් ද සමග දෙමටගොඩ පිහිටි කීර්ති ගේ මවගේ නිවසට අප්‍රේල් 13 වන දින කඩාවැදුනු අපරාධ විමර්ශන ඒකකය (සීඅයිඩීය) පවුලේ සාමාජිකයන්ට තර්ජනය කලහ. ආන්ඩුව විකොස තරුන ව්‍යාපාරය හා පක්ෂයේ පුවත්පත් තහනම් කිරීමට හදිසි නීති බලතල යොදාගත්තේය. පක්ෂ කාර්යාලයට කඩාවැදුනු පොලිසිය විසින් මහනුවර බන්ධනාගාරයේ දී විකොස සාමාජිකයන් දෙදෙනෙක් මරාදැමූහ.

පක්ෂ සාමාජිකයන්ගේ හා ආධාරකරුවන්ගේ උදව් ඇතිව කීර්ති කොලඹ අවට විවිධ ස්ථානවල රැඳීසිටිමින් අත්අඩංගුවට ගැනීමෙන් වැලකී සිටීමට සමත් විය. මෙම රාජ්‍ය මර්දනය මධ්‍යයේ වුවද ඔහු සතුවූ ධෛර්යය සියලු දෙනාට ම ශක්තියක් විය. විප්ලවවාදී ඉදිරිදර්ශනය පිලිබඳව ඔහුට පැවති ශුභවාදී ආකල්පය, ශ්‍රීලංකාවේ කැලඹීම් සහගත තත්වය ධනවාදයේ පුලුල් ජාත්‍යන්තර අර්බුදයක කොටසක් ය යන අවබෝධය මත පදනම් විය.

1944 බ්‍රෙට්න්වුඩ්ස්හි පිහිටුවන ලද පශ්චාත් යුද කාලීන පර්යායේ මුල් ගලක්ව පැවති රත්රන් හා එක්සත් ජනපද ඩොලරය අතර සම්බන්ධය 1971 දී එක්සත් ජනපදයේ ජනාධිපති රිචඩ් නික්සන්  විසින් අහෝසි කලේය. ප්‍රන්සයේ ධනපති පාලනය 1968 මැයි-ජූනි මහා වැඩ වර්ජන මගින් අරටුවට ම සොලවාලීය. 1970 ගනන් ආරම්භයේ රටක් පාසා රටක් තුල වැඩ වර්ජන හා දේශපාලන අරගල පැනනැගෙමින් තිබුනි. ශ්‍රීලංකාවේ ගම්බද තරුනයන් අතර පැවති කැරලිකාරිත්වය පිලිබිඹු  කලේ ජාත්‍යන්තර ක්‍රියාවලියකි.

දේශපාලන සහන පිදීමේ හෝ අශුභවාදය කරා යොමු වූ කුමන හෝ ප්‍රවනතාවකට එරෙහිව කීර්ති ක්ෂමා විරහිතව සටන් කලේය. විකොස ජනතා විමුක්ති පෙරමුනේ සංවිධානයක් නොවන බව පැහැදිලි කරන ලිපියක් බාරදීමට, සිසිර ජයසූරිය ද ඇතුලු ප්‍රමුඛ සහෝදරවරුන්  දෙදෙනෙක් ලසසප නායකයෙකු හමුවූ බව දැනගත් කල ඔහු කෝපයට පත්විය. ගාල්ලේ මා රැඳී සිටි ස්ථනයේ සිට කීර්ති හමුවීමට පැමින සිටියදී, ස්පයික්ගේ නිවසෙහි පැවති එම රැස්වීමට මම ද සහභාගී වූයෙමි.

එම ක්‍රියාව කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා කරන අරගලයට ඉඳුරාම පටහැනි බව කීර්ති අවධාරනය කලේය. විකොස කල යුතුව ඇත්තේ කම්කරු පක්ෂයක් ලෙස පෙනී සිටිමින් ලසසපය සැබවින් ම  ධනපති රාජ්‍යය ආරක්ෂා කරන ආකාරය පෙන්වා දීමයි. ලසසපය පාලක සභාගයෙන් ඉවත්විය යුතු යයි අප කියා සිටිය යුතුය. ලසසපයෙන් ආරක්ෂාව ඉල්ලා සිටීම මුලුමනින් ම වැරදිය. ඔවුන් රාජ්‍ය ප්‍රචන්ඩත්වය දිගේලි කරන ආන්ඩුවේ කොටස් කරුවන් යයි කීර්ති පැහැදිලි කලේය. කම්කරුවන් ලසසපය වටලා කිවයුත්තේ හවුල් ආන්ඩුවට ඇතුල්වීම ඔවුන්ගේ අවසානය බව යයි කීර්ති අවධාරනය කලේය.

සිසිර ජයසූරිය හා තවත් අය ඉමහත් පීඩනය හමුවේ පක්ෂය හැරගිය අතර 1970 ගනන් මුල ලැබූ අත්දැකීම්වලින් විකොස ඉදිරි අරගල සඳහා පන්නරය ලැබීය. පක්ෂයේ ඉදිරි දර්ශනය වෙනුවෙන් කීර්ති ස්පයික් සමග සමීපව වැඩ කලේය. නන්ද වික්‍රමසිංහ, කමලසිරි රත්නායක හා ආනන්ද වක්කුඹුර එහි දී කීර්ති සමග එක්ව වැඩ කලහ. සමාජවාදී සමානතා පක්ෂයේ වත්මන් ප්‍රධාන ලේකම් විජේ ඩයස් එවකට ලංඩනයේ සිට කීර්ති සමග නිරන්තරව අදහස් හුවමාරු කර ගත්තේය.

කම්කරුවන් හා තරුනයන් අතර බෙදාහැරීම සඳහා කෙටි පුවත් පතක් විකොස අරම්භ කලේය. එවකට කීර්ති සමග මා ජීවත් වූයේ විදුලිය හෝ නලජල පහසුකම්වලින් තොර අතිශයින් ම නොදියුනු ප්‍රදේශයකය. එහෙත් අපට ආරක්ෂාව තිබුනි. වක්කුඹුර හා තවත් සහෝදරවරුන් දෙදෙනෙක් අප සමග සිටියහ.

විකොසෙහි ප්‍රතිපත්‍යානුකූල ආස්ථානය කම්කරුවන්, තරුනයන් හා බුද්ධිමතුන් අතරින් වැඩිවන සහයෝගයක් දිනා ගත්තේ ය. රජයේ මුද්‍රනාලයේ හා කොලඹ වරායේ වෘත්තීය සමිතිවල නායකත්වය විකොස සාමාජිකයන් අතට පත් විය. දුම්රියේ හා මහ බැංකුවේ ද ප්‍රබල සහයෝගයක් එයට  හිමිවිය. කොලඹ විශ්ව විද්‍යාල ආචාර්ය වරුන් ගනනාවක් ම සාකච්ඡාවන් සඳහා කීර්තිට ආරාධනය කලහ.

හදිසි නීති පාලනය අවසන් වීමෙන් පසුව, පක්ෂය පසුකර ආ අත්දැකීම්වල දේශපාලන මානය ගැඹුරු කිරීම සඳහා කීර්ති උත්සුක විය. ඔහු විකොස ඉතිහාසය ගැන ලිවීම ආරම්භ කල අතර බ්‍රිතාන්‍ය ශාඛාව ඉදිරි දර්ශන ලියවිල්ලක් පිලියෙල කරන ලෙසට උපදෙස් දෙන විට ඔහු ඉන් කොටස් දෙකක් සම්පූර්න කර තිබුනි. 1972 වසරේ පසු භාගයේ පැවැත්වූ විකොස තෙවන සම්මේලනයේදී ඉදිරිදර්ශන ලියවිල්ල ඒකච්ඡන්දයෙන් සම්මත විය. ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ න්‍යායික අරගලය පිලිබඳ විශ්ලේෂනයක් සහිතව එය අවධාරනය කලේ පක්ෂය තුල ජාතිකවාදය දෙසට යොමුවන ඕනෑ ම ප්‍රවනතාවකට එරෙහිව සටන් වැදීමේ අවශ්‍යතාවයි.

කීර්තිගේ දේශපාලන ජීවිතය 20 වන සියවසේ මූලෝපායික අත්දැකීම් සමග බැඳී තිබුනි. විශේෂයෙන් ම ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ගොඩනැගීම තුලින් සමාජවාදය සඳහා අරගලය වෙත තරුනයන්ගේ කැපකිරීම් කෙරෙහි ඔහුගේ බලපෑම ඉමහත් විය.

1969 අග මට කීර්ති හමුවන විට ඔහු සංස්කෘතිකමය වශයෙන් පරිපූර්න මිනිසෙක් විය. මාක්ස්වාදී සංස්කෘතිය හා දේශපාලන විරුද්ධවාදීන් පිලිබඳව හොඳ පුස්තකාලයක් ඔහු සතු විය. ඔහු ස්පයික්ගේ මෙන් ම විශ්ව විද්‍යාල පුස්තකාලයන්ද ප්‍රයෝජනයට ගත් අතර සියලු ම සහෝදරවරුන් පුස්තකාලයක් ගොඩනැගීම හා මාක්ස්වාදය විද්‍යාත්මකව හැදෑරීම කරා යොමු කිරීමට උත්සුක විය.

කීර්ති කලාවට හා සංස්කෘතියට ඇලුම් කලේය. ශ්‍රේෂ්ඨ සාහිත්‍ය කෘතීන් බොහොමයක් ඔහුගේ පුස්තකාලයේ තිබුනි. විශේෂයෙන් ම ටෝල්ස්ටෝයි, පුෂ්කින්, ඩොස්ටොව්ස්කි විසින් රචනා කල රුසියානු නවකථාවලට ඔහු ඇලුම් කලේය. පිකාසෝ ගේ චිත්‍ර හා ඩී.එච්. ලෝරන්ස්ගේ නවකථා ද ඔහුගේ සිත බැඳගත්තේය. පුරාතන ඉන්දියානු කාව්‍ය හා සිංහල සාහිත්‍ය ගැන මනා වැටහීමක් ඔහුට තිබුනි. ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතය කෙරෙහි ඔහු විශේෂ ලොල් කමක් දැක්වීය.

ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයට සම්බන්ධ වීමට පෙර කීර්ති ප්‍රතිභා සම්පන්න තරුන කලාකරුවෙක් විය. ශ්‍රීලංකාවේ ඉපැරනි හා ප්‍රකට කලා නිර්මානයක් වන ඉසුරුමුනියේ පෙම් යුවල ගැන ඔහු ලිවූ ප්‍රථම කවි පෙල 1962 ඉරිදා සිලුමින පත්‍රයෙහි පලකෙරුනි. එවිට ඔහුගේ වයස අවුරුදු 14 කි.

ඔහු පුවත්පත්වලට දිගට ම කවි ලිවූ අතර 1963 දී කවි පොතක් පල කලේය. ඔහු සංස්කෘතික අංශ පිලිබඳ ලිපි පලකල *කවුලුව* ප්‍රකාශනයේ සංස්කාරක වරයෙක් විය. දැනුම සඟරාවේ පලකල 1966 දී ඔහු රචනා කල *සිරකරුවා* නම් කෙටිකථාව විශේෂයෙන්ම මගේ සිත් ගත්තකි. ධනවාදය යටතේ කාන්තාව සමාජයේ සිරකාරියක් වන ආකාරය කතාව තේමා කොට ගත්තේය. ඔහුගේ කලාත්මක නිර්මාන ශීලිත්වය ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ වගකීම් සම්භාරය හමුවේ යටපත් වුවද සංස්කෘතිය හා කලාව කෙරෙහි වූ ඔහුගේ ලැදියාව කිසි විටෙකත් අඩු නොවීය.

ඔහුගේ අභාවයෙන් විසි වසරක් ඉක්මගොස් ඇති බව ඇදහීම පවා දුෂ්කරය. ඔහුගේ මරනින් පසුව සිය දැනුවත් ජීවිත කාලය ම කැපකල ව්‍යාපාරය වූ එවක විකොස හා දැන් සසප බොහෝ වර්ධනයන් අත්කරගෙන තිබේ. හජාජාක සියලු ශාඛාවන්ගේ අසාමාන්‍ය සාමුහික උත්සාහයෙන් ගොඩනගනු ලැබූ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* අන් සියල්ලටමත් වඩා මේ කාරනය පැහැදිලි කරයි. ලෝකය පුරා කම්කරුවන් හා තරුනයන්ගේ දේශපාලන අධ්‍යාපනය සඳහා දිනපතා ඉන් ඉටුවන මෙහෙය සලකන කල ඔහුගේ න්‍යායික හා දේශපාලන අරගලය ජීවමානව පවතිනු ඇත.

© www.wsws.org